Alcohol and Drug Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

**2025.08.13**

**ADIC මාධ්‍ය නිවේදනය**

## ගංජා වගාවට අවසර ලබා දීමෙන් රටේ ආර්ථිකය දියුණු කළ හැකි ද ?

2025 අගෝස්තු 12 වන දින මාධ්‍ය හමුවක් පවත්වමින් අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතා සඳහන් කර සිටියේ  ආරක්ෂක විධිවිධාන යටතේ ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතියක් ලෙස කංසා වගාව සඳහා විදෙස් ආයෝජන 7කට අවසර ලබා දී ඇති බවයි. මෙහි අරමුණ ලෙස එතුමා පවසන්නෙ ආරක්ෂක විධිවිධාන යටතේ වගාවේ සියලුම කොටස් අපනයනය සඳහා පමණක් යොදවමින් එයින් රටට ආර්ථිකමය වාසි ලබා ගැනීමට හැකි බවයි.

මීට පෙර මෙම තීරණය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළ අවස්ථා වලදී ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය, ශ්‍රී ලංකා මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය, ප්‍රජා වෛද්‍යවරුන්ගේ සංගමය, ADIC ආයතනය ඇතුලු විවිධ සංවිධාන සහ ප්‍රජාවේ බලපෑම නිසා එම උත්සාහය යටපත් වී තිබුණි.

වර්තමාන රජය, පෙර රජය විසින් ගෙන ආ එම යෝජනාව  ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව පැවසීම ඉතාම කණගාටුවට කරුණකි. වර්තමාන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය ආමාත්‍ය මෙම යෝජනාව පෙර රජය ගෙන ඒමට උත්සාහ කිරීමේදී එය උපහාසයට ලක්කරමින් එම යෝජනාවට විරුද්ධ වීමක් එතුමාගේ සමාජ ජලා ගිණුම් වල දක්නට ලැබුණි. එවැනි නිවැරදි ස්ථාවරයක සිටි  පුද්ගලයෙක් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය ආමාත්‍ය වූ පසු එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම කණගාටුදායකය.

ගංජා නීත්‍යානුකූල භාණ්ඩයක් බවට පත් කර ගැනීම සඳහා කොතරම් උත්සාහ කළ ද ඒ සඳහා මහජන විරෝධයත්, විද්වතුන්ගේ විරෝධයත් නිසා ලෝකයේ ගංජා නීතිගත කිරීමේ උත්සාහය අසාර්ථක විය. මෙම තත්ත්වය වෙනස් කිරීමේ උපායක් ලෙස ගංජා ව්‍යාපාරය ‘ජෝර්ජ් සොරෝස්’ වැනි ව්‍යාපාරිකයන් සමඟ  එක්ව ගංජා ආර්ථික භාණ්ඩයක්, අපනයන ආදායමක් ලබාගත හැකි භාණ්ඩයක් ලෙස නව මුහුණුවරකින් ඉදිරිපත් කරමින් දැනට පවතින නීති වගාව සඳහා පමණක්ම යැයි පවසමින් වෙනස් කිරීමට උත්සාහ කරයි. එමඟින් එය ඔවුන්ගේ අවසාන අරමුණ ජයග්‍රහණය කර ගැනීම සඳහා යොදා ගන්නා උපක්‍රමික සැලැස්මකි. නව රජය එම උපක්‍රමයේ කොටස්කරුවෙක් බවට පත්වීම ඉතාම කණගාටුදායක තත්ත්වයකි.

අන්තර්ජාතික වෙළඳපොළ තුළ ගංජා අධි සැපයුමක් පවතින බැවින් ඉල්ලුම ඉහළ නොයාම, ගංජා නිෂ්පාදන අතිරික්තයක් පවතින සහ වෙළඳපොළ සම්තෘප්ත වී ඇති බැවින් ගංජා වෙළඳපොළ මේ වනවිට වර්ධනයක් පෙන්නුම් නොකරයි.

ආර්ථික ප්‍රතිලාභක් ඇති බව පවසන සාවද්‍ය ප්‍රකාශ මත මෙවැනි තීරණ ගැනීම තුළින් අප වැටී ඇති ආර්ථික අර්බුදයන් තවත් ආර්ථික සහ සමාජීය අර්බුද ගණනාවක් ඇති කරන තත්ත්වයක් බව ඉතා කණගාටුවෙන් ප්‍රකාශ කළ යුතුය. වර්තමාන රජයෙන් මෙවැනි තීරණයකට එළඹීම පුදුම සහගත සහ සැක උපදවයි. විශේෂයෙන් පසුගිය රජයන් සිදුකළ බොහෝ ක්‍රියාවන් විවේචනය කිරීමත් ඒවා නවතා දැමීමත් සිදු කරන  වර්තමාන රජය  පෙර රජයන් ගෙන ආ යෝජනාව  ඉතා වේගයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම ගැටලු සහගත ඉතාම ප්‍රබල සැකයක් ජනිත කරවයි.

මෙම තීරණය ක්‍රියාත්මක කරන බලධාරීන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙන ලෙසද අප අවධාරණය කිරීමට කැමැත්තෙමු.

1. දැනටමත් නීතියෙන් තහනම් කර ඇති විවිධ මත්ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ ලබා ගැනීමට හැකිව ඇත. එවැනි පසුබිමක ආරක්ෂිතව වගා කිරීම තුළින් ආරක්ෂිත කලාපයෙන් බැහැරට ගංජා වගාව නොයන බවට ලබා දිය හැකි සහතිකය කුමක් ද?

2. ගංජා වගාව තුළින් ලෝක වෙළඳපොළ තුළ අපට ලබා ගත හැකි වෙළඳපළ ප්‍රමාණය, මිල ගණන්, ලාභය සහ රටට හා රජයට ලැබෙන විදේශ මුදල්වල සැබෑ ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම සඳහා ස්වාධීන සහ විශ්වසනීය ජාත්‍යන්තර වෙළඳපොළ සක්‍යතා අධ්‍යනයක් සිදු කර තිබේද?

3. චීනය, නෙදර්ලන්තය වැනි වත්මන් "නීත්‍යානුකූල" වගාකරුවන් සමඟ තරඟ කිරීම ප්‍රමාණවත් හැකියාවක් අපට තිබේදැයි සොයා බැලීමක් කර තිබේද?

4. ශ්‍රී ලංකාව වැනි කුඩා රටකින් සිදු කරන "නීත්‍යානුකූල" අපනයන සමඟ පහසුවෙන් තරඟ කළ හැකි වාර්ෂිකව ගංජා ටොන් මිලියන ගණනක් නිෂ්පාදනය කරන වත්මන් ජාත්‍යන්තර නීති විරෝධී ගංජා වෙළඳපොළ පිළිබඳව කරුණු සැළකිල්ලට ගෙන තිබේද?

5. ඕනෑම බහු ජාතික ගංජා සමාගමකට ශ්‍රී ලංකාව තුළ තනිව හෝ දේශීය හවුල් කරුවෙකු හෝ රජය සමඟ ගංජා වගා කිරීමට අවසර ලබා දෙන්නේද?

6. විදේශ විනිමය උපයා ගත හැකි වඩාත් සුදුසු ආර්ථික බෝග (උදා: එඬරු, බෝංචි - බෙහෙත් එඬරු, පැඟිරි ආදිය ) පිළිබඳ සලකා බලා තිබේද?

7. ගංජා වගාව නිසා විදේශ විනිමය අර්බුධ වලට සාර්ථකව මුහුණ දුන් රටවල් මොනවාද?

8. ගංජා සමාගම් සඳහා දුම්කොළ කර්මාන්තය විසින් සිදුකරන ලද විශාල ආයෝජන පිළිබඳ කම්ටුව සැළකිල්ලට භාජනය කර තිබේද ?

අවසාන වශයෙන් කිවයුතුව තිබෙන්නේ මෙම තීරණය අපගේ රටේ සෞඛ්‍ය, සමාජීය, ආර්ථික සහ ආරක්ෂාවට ඉදිරියේදී දැඩි බලපෑමක් ඇති කරමින් රට ආපස්සට ගෙනයන යොජනාවක් ලෙසය.

මහජන හිතවාදී රජයක් ලෙස මෙම තීන්දුව වහා ආපසු හැරවීම සඳහා මැදිහත් වන ලෙස මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය අදාළ බලධාරීන්ට අවධාරණය කර සිටිමු.

**මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය. (ADIC ආයතනය)**